www.wsws.org
ලෝක සමාජවාදී වෙබ් අඩවිය
හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ප්‍රකාශනය

# බැංකුකරුවන්ගේ බැංකුවෙන් ජී-8 සමුලුවට අනතුරු ඇඟවීමක්

**A warning to the G-8 from the bankers' bank**

**නික් බීම්ස් විසිනි**
**2005 ජුලි 05**

සෞඛ්‍යමත් වර්ධනයක් පෙනෙන්නට තිබුන ද, භූගෝලීය ආර්ථිකයේ ගැටලු තීව්‍ර වෙමින් පවත්නා බවට අනතුරු ඇඟවුමක් ජී-8 සමුලුව අද්දර දී මහ බලවතුන්ට ලැබී ඇත. මෙම අනතුරු ඇඟවුම කෙරෙන්නේ පසු ගිය සති අන්තයේ නිකුත් කෙරුනු, ජාත්‍යන්තර සමථ බැංකුවේ (බීඅයිඑස්) 75 වන වාර්ෂික වාර්තාවෙනි. මධ්‍යම බැංකුකරුවන්ගේ බැංකුව ලෙසින් හඳුනන බීඅයිඑස් බැංකුවට අනුව, ලෝක ආර්ථිකය තුල වැඩෙමින් පවත්නා ජාත්‍යන්තර නය සහ අසමතුලිතතාවන් විසින් ආර්ථික හා මූල්‍යමය අර්බුදයක කොන්දේසි නිර්මානය කෙරී ඇත.

දශක තුනකට ආසන්න කාලයක් තුල ලෝක ආර්ථිකයේ හොඳ ම වර්ධන අගය වන, සියයට 5ට ඉතා ආසන්න වූ 2004 වර්ධනය විස්තර කරමින්, බීඅයිඑස් බැංකුව මෑත කාලයේ නිෂ්පාදන වර්ධනය සහ අඩු උද්ධමන වේගය ''මේ තාක් හොඳයි'' යන ආකාරයට සතුටින් පිලිගන්නා අතර, ''වැඩෙන බාහිර සහ අභ්‍යන්තර අසමතුලිතතාවන්'' පිලිබඳ අසතුට පල කරයි. ''මින් දෙවැන්න නයෙහි, වත්කම් මිලෙහි සහ ආයෝජනයේ ක්ෂනික නැගීම් නිරන්තරව බැඳී පවත්නා මූල්‍යමය පීඩනයේ නිරන්තර ආවර්තයන්ට තුඩු දෙයි.''

එක්සත් ජනපද ඩොලරයට එරෙහිව තම විනිමය ශක්තිමත් කිරීමේ අරමුනෙන් බොහෝ රටවල් තම මූල්‍ය පිලිවෙත් පහසු කිරීමට සහ විනිමය අරමුදල් සමුච්චය කිරීමට දරන ප්‍රයත්නයේ දී ''භූගෝලීය ද්‍රවශීලතාවේ දැවැන්ත ප්‍රසාරනයක්'' ඇති විය හැකි බැව් වාර්තාව පෙන්වා දෙයි. භූගෝලීය ආර්ථිකයට ''ගැටලු'' ඇතැයි යන්න සම්බන්ධයෙන් එකඟතාවකට පැමිනීමට අසීරු වුව ද, එවැන්නක් පිලිබඳ නිශ්චිත ''අනාවරනයන්'' පවත්නා බවට යම් එකඟතාවක් තිබූ බැව් පවසමින් වාර්තාව සැකසේ. ''ඓතිහාසික සම්මතයන්ගෙන් ඉතා පැහැදිලි අපගමනයන් එක් වර පෙන්නුම් කරන දර්ශකයන් සංඛ්‍යාව යමෙකුට සරලව නො තකා හැරිය නොහැකි ය.''

''අවධානය ඉල්ලා සිටින'' ජාත්‍යන්තර අසමතුලිතතාවන් අතර පහත සඳහන් දෑ පවතී:

බොහෝ කාර්මික රටවල සහ ''මතු වන ආසියාවේ'' නියම පොලී අනුපාතයන් (මධ්‍යම බැංකුවෙන් සැකසූ පදනම) පහල වැටෙමින් ශූන්‍යයට ලඟා වෙමින් පැවතීම.

දිගු කාලීන බැඳුම්කර සඳහා වූ නාමික රේට්ටුව කැපී පෙනෙන අයුරින් පහත වැටීම සමග නය ව්‍යාප්තිය පටු වීම - එනම් පහල හා ඉහල අවදානම සහිත වත්කම් සඳහා පොලී රේට්ටු අතර පවත්නා වෙනස.

බොහෝ කාර්මික රටවල ගෘහස්ථ ඉතිරි කිරීම් පහල වැටීමේ ප්‍රවනතාව සහ ගෘහස්ථ නය වාර්තාගත ඉහල මට්ටම්වලට නැගීම.

බොහෝ රටවල නිවාස මිල ඉහල නැගීම.

මේ සමග ම, එක්සත් ජනපද ගෙවුම් ශේෂ පරතරය මගින් ඇති කරනු ලබන බාහිර අසමතුලිතතාවන් ''පශ්චාත් යුද කාලයේ කවර දාක හෝ නොතිබූ පරිමානයකට විශාල වීම.''

එහි වචන පරිස්සමින් තෝරා ගනිමින් - බාධාවන් නිර්මානය කිරීම මධ්‍යම බැංකුවක කාර්යය නො වේ - බීඅයිඑස් බැංකුව කියා සිටින්නේ කවර හෝ මූල්‍යමය ප්‍රපංචයක් ''නැවත පෙර තිබූ තත්වයට පැමිනිය යුතු'' බව යි. බැංකුව තව දුරටත් මෙසේ කියා සිටී: ''එවන් සමහන් වීමක් ක්‍රමයෙන් හා සෙමින් සිදු විය හැකි නමුත්, එය ක්ෂනික හා විනාශකාරී දෙයක් ද විය හැකි ය. මහා පරිමානව ගත් කල කුමක් සිදු වේ ද යන්න නිර්නය කෙරෙන්නේ පූර්න අවබෝධයක් ඇතැයි මවා පෙන්විය යුතු යථා-මූල්‍ය සබඳතා මත ය.''

පුලුල් වෙමින් පවත්නා එක්සත් ජනපද ගෙවුම් ශේෂ හිඟය ''බලගතු දිගු කාලීන ගැටලුවක්'' බැව් වාර්තාව කියා සිටී. ''එය අනෙකුත් මූල්‍ය වෙලඳ පොලවල ආරාවුල් සමග යට ගැසුනු, ඩොලරයේ අපාලිත බැස්මකට සහ අවසානයේ දී අවපාතයකට පවා තුඩු දිය හැකි ය.'' වඩාත් ක්ෂනික, ''ආරක්ෂනවාදී පීඩනය නැවත මතු වීමක්'' එමගින් සිදු විය හැකි ය.

බීඅයිඑස්ට අනුව, පෙර නුවූ විරූ වෙලඳ පරතරය (අද දින එය එක්සත් ජනපද දල ජාතික නිෂ්පාදිතයෙන් සියයට 6කට වඩා වැඩි ය), බාහිර නය වර්ධනයේ වේගය, එක්සත් ජනපදය බාහිර මූල්‍ය කටයුතුවල දී අනෙකුත් මධ්‍යම බැංකු මත රඳා පැවතීම, සහ එක්සත්

ජනපද නයෙන් වැඩිමනත් ප්‍රමාණයක් ආයෝජනය කරනවාට වඩා පරිභෝජනය සඳහා යොදා ගැනීම යන හේතු ආනුෂංගික ගැටලුවක් මතු කරයි.

''තව දුරටත්, නූතන මූල්‍ය වෙළඳ පොලවල අන්තර් රඳා පැවැත්ම අනුව, ඩොලරයට පමනක් මෙම ගැටලු සීමා නොවනු ඇත. එක්සත් ජනපද ඩොලර්වලින් වටිනාකම නියම කරන ලද වත්කම්වලට ගෙවීමට සිදු වන අවදානම් වට්ටම් ඉහල යෑම සියලුම වර්ගවල වත්කම්වල මිල කෙරෙහි බල පෑම් ඇති කරමින් දීර්ඝ කාලීන අනුපාතිකයන් සහ ව්‍යාප්තීන් ඉහල දමනු ඇත.

වෙනත් වචනවලින් කිව හොත්, එක්සත් ජනපද ඩොලරයෙහි ඇති වන ශීඝ්‍ර බැස්මක් පොලී අනුපාතයන්ගේ තියුනු නැග්මකට තුඩු දිය හැකි අතර රටවල් ගනනාවක මතු වී ඇති නිවාස බුබුලු පුපුරුවා හරිමින් එය ලොව පුරා ව්‍යාප්ත විය හැකි ය. එක්සත් ජනපද අනුපාතයන්ගේ වැඩි වීමක්, ආයෝජනය සඳහා දිගු කාලීන කොන්දේසි යටතේ එක්සත් ජනපද බැංකුවලින් පහල අනුපාතවලට නය ලබා ගත් මූල්‍ය ආයතන හෙවත් ඊනියා ''ඔසවා ගෙන යනු ලබන වෙලඳාම්වලට'' සහ ඉහල අනුපාතයන් යටතේ බැංකුවල රඳවා ඇති අවදානම් සහිත වත්කම්වලට ද බලගතු ලෙස බල පෑ හැකි ය.

බීඅයිඑස් බැංකුව එක්සත් ජනපද වෙලඳ පරතරයේ අන්තරායන් පෙන්වා දෙන අතර ම අපනයනයන්ගේ වැඩි වීමක් මගින් මෑත අනාගතයේ එම පරතරය අඩු වීමේ ආරම්භයක් සම්බන්ධයෙන් බලාපොරොත්තු නො තබයි.

''දල ජාතික නිෂ්පාදනයේ සියයට 10ක් පමනක් වන අගයක් දක්වා පහත වැටී ඇති නිෂ්පාදන ක්ෂේත්‍රයේ යලි පිබිදීමක් පහසු නොවනු ඇත. ඒ සමග ම නිෂ්පාදන ක්ෂේත්‍රයේ ලාභ අඳුරේ පවතී. එක්සත් ජනපදය තුල වත්මන් ආයෝජන වර්ධනයෙහි වැඩි පංගුවක් වෙලඳ භාන්ඩ සඳහා යෙදවීම ද දිරිසුන් කෙරෙන සංඥාවකි.''

චීනය, ඉන්දියාව සහ අනෙකුත් අඩු වියදම් ආර්ථිකයන් සමග තරගකාරිත්වය තීව්‍ර වන තතු යටතේ, එය ''ජාත්‍යන්තර වෙලඳ පොලෙහි පංගුව නැවත අත්පත් කර ගැනීමක් බලාපොරොත්තු විය හැකි දිරිගන්වන සුලු ක්ෂනයක් නො වී ය.''

මූල්‍යමය අසමතුලිතතාවන් මගින් ඇති තරම් අවධානයක් යොමු නො කිරීම සහ ''ස්වයං අවශ්‍යතාවයෙන් ම ක්‍රියා කිරීම මගින් වඩාත් යහපත් දෙය සිදු විය නොහැකි බව අවශ්‍ය තරම් හඳුනා ගෙන'' නොමැති වීම සම්බන්ධයෙන් බීඅයිඑස් බැංකුව අනතුරු ඇඟවී ය. ''දැන් අවශ්‍යව ඇත්තේ මෙම බාහිර අසමතුලිතතාවන්ගේ බැට කෑ සියලු දෙනා අතර යථා කතිකාවකි. අනාගතයේ දී වඩාත් අප්‍රසන්න විකල්පයන් මග හැරීම සඳහා සියලු දෙනාම දූන් යම් අප්‍රසන්න එකඟතාවන්ට කැප වීම අවශ්‍ය ය.''

බීඅයිඑස් වාර්තාවේ, මූල්‍යමය වෙළඳ පොල සම්බන්ධිත දිගු පරිච්ඡේදයකින්, නය ව්‍යුත්පන්න වෙළඳ පොලෙන් පැන නැගිය හැකි ගැටලු පෙන්වා දෙයි. ජෙනරල් මෝටර්ස් සහ ෆෝර්ඩ් සමාගමේ නය පහත හෙළීමෙන් වෙළඳ පොල සාපේක්ෂ වසයෙන් හිස එසවුව ද, ''පීඩනය යටතේ වෙළඳ පොල ක්‍රියාත්මක විය යුත්තේ කෙසේ ද යන්න පිලිබඳව එය සත්‍ය දර්ශකයක්'' නොවනු ඇත. මෝටර් රථ නිෂ්පාදකයින්ගේ නය පහත හෙලීම කල් තියාම දැනුම් දීම මගින් මෙය සිදු කෙරින. නමුදු විශ්මයජනක සිදු වීමකින් වඩා විශාල හානියක් සිදු විය හැක.

අර්බුදයට සම්බන්ධිත මුලු මුදල විස්මිත හා දැවැන්ත වන අතර එය වැඩෙමින් පවතී. නය ගන්නා පුද්ගලයින් පෙරලා එම නය ගෙවීම් පැහැර හැරීමේ අවදානම ඉවත් කිරීම සඳහා ආයෝජකයින්ට පහසුකම් සැපයෙන නය පැහැරහැරීම් සම්බන්ධිත ගනුදෙනු වෙළඳ පොල (සීඩීඑස්) දර්ශකීයව ප්‍රසාරනය වෙමින් පවතී.

බීඅයිඑස් ගනනයකට අනුව නය ගෙවීම් පැහැර හැරීමෙන් මෙම සීඩීඑස් වෙළඳ පොලට ලැබී ඇති කොන්ත්‍රාත්තුවල මුලු අගය 2004 ජූනි මාසය අවසන් වන විට ඩොලර් ට්‍රිලියන 4.5ක් වන අතර මෙය තෙවසරකට පෙර අගය මෙන් හය ගුනයකි.

වාර්තාවට යම් කේන්ද්‍රීය තේමාවක් තිබුනේ නම්, ඒ වනාහී එලැඹෙන කාල පරිච්ඡේදයේ ආර්ථික හා මූල්‍යමය ගැටලු වඩාත් නරක අතට හැරීමක් බලාපොරොත්තු විය හැකි බව යි. භූගෝලීය ආර්ථිකය තුල ඇති වූ ප්‍රධාන ව්‍යූහාත්මක වෙනස්කම් තුල මුල් බැසගත් අභ්‍යන්තර සහ බාහිර අසමතුලිතතාවන් ''කඩාකප්පල්කාරී බලපෑම්'' ඇති කරමින් දිගේලි විය හැකි බැව් වාර්තාව පෙන්වා දෙයි. එවන් වාතාවරනයක් තුල පවත්නා අන්තරාය නම් ''පොදු ප්‍රතිසතිතතාවන් සඳහා සෑම රටක් ම තනි තනිව විසඳුම් පිලිවෙත් සෙවීමට යාම යි''. වෙනත් වචනවලින් පැවැසුවහොත්, ගැටලු පැන නගින්නේ ජාතික රාජ්‍ය පද්ධතිය සමග ගැටෙන්නා වූ ධනේශ්වර ආර්ථිකයේ භූගෝලීය ස්වභාවයෙනි.

මේ අනුව බීඅයිඑස් ට අවශ්‍ය වන්නේ ඒකාබද්ධ විසඳුම් සෙවීම සහ ජාත්‍යන්තර සාර්ව මූල්‍ය සමතුලිතතාවේ රාමුවක් සංස්ථාපනය කිරීම යි. නමුත් ''ජාතික අවශ්‍යතාවන් මුලු බැස ගත් යථාර්ථයක් පවත්නා තතු'' තුල එවන් ජාත්‍යන්තර රාමුවක් ක්‍රියාත්මක කිරීම දුෂ්කර කාර්යයක් බැව් එය පිලිගනී.

© www.wsws.org